# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2257/20 – 2021 දෙසැම්බර් 06 වැනි සඳුදා – 2021.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 253 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2020/WS/49.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/PDB/4/3/2/23.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් එම උපලේඛනයේ II වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය:** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ බටහිර කෝරලේ සුළු කොට්ඨාසයේ, ගිරාකඩුව (631) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගිරාකඩුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/PTD/2020/455 හා 2020.12.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශතාවයේ විස්තරය:** මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතියේ, ගිරාකඩුව පොම්පාගාරයේ ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා අතිරේක ඉඩම් කොටසක පරවශතාව අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'A' – හපුගස්පිටිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0162**

උතුරට:ටී.එම්.ඩබ්ලිව්.එස්.බණ්ඩාර හිමිකම් කියන හපුගස්පිටිය වත්ත; නැගෙනහිරට: ටී.එම්.ඩබ්ලිව්.එස්.බණ්ඩාර හිමිකම් කියන හපුගස්පිටිය වත්ත සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ එන්. එච්. එම්. ඩබ්ලිව්.ඒ.ඩී.බී. ඒකනායක හිමිකම් කියන හපුගස්පිටිය වත්ත; බටහිරට: එන්. එච්. එම්. ඩබ්ලිව්.ඒ.ඩී.බී. ඒකනායක හිමිකම් කියන හපුගස්පිටිය වත්ත සහ මාර්ගය.

EOG 12 - 0056



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2021 අංක 254 දරන ආඥාව

මගේ යොමු අංකය: 4-3/14/2020/CEB/82.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/KU/LND/ACQUS/1/5.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 දෙසැම්බර් මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි**: ප්‍රාදේශීය ලේකම්, කුච්චවේලි.

II. **ඉඩමේ විස්තරය**: නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩ්ඩුක්කුලම් පත්තු නැගෙනහිර සුළු කොට්ඨාසයේ, කුඹුරුපිඩ්ඩි (240) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඹුරුපිඩ්ඩි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක Tri/TKCH/2020/172 හා 2020.11.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පෙරියතෝට්ටම් – ප්‍රමාණය: හෙක්. 0.0334**

උතුරට:ටෝපෝ.පී.පී. 37හි කැබලි අංක 232 (කොටස ටී.පී.346434) සහ කැබලි අංක 233 පාර (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට සහ දකුණට: ටෝපෝ.පී.පී. 37හි කැබලි අංක 232 (කොටස ටී.පී.346434); බටහිරට: ටෝපෝ.පී.පී. 37හි කැබලි අංක 233, පාර (ප්‍රාදේශීය සභා) සහ කැබලි අංක 232 (කොටස ටී.පී.346434).

EOG 12 - 0057